*සැ. යු.* - 2014.12.05 වැනි දින පළ වූ අංක 1892 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,893 - 2014 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.12.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1062 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1063 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1068 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 472

DIRF/RECT/259/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි 2014 ජනවාරි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙන සේ, ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පලකරනු ලැබ තිබේ.

සී/57267 කෙඩෙට් නිලධාරි උඩවත්ත කංකානම්ගේ රොෂාන් චමින්ද උඩවත්ත

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

12-333

---

2014 අංක 473

MOD/DEF/2/01/ENL/01/CDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2014.06.21 දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58872 කෙනි - බමුණු ආරච්චි පතිරගේ ඩොනේෂියන් අබිෂෙක් බමුණු ආරච්චි, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58865 කෙනි මහදුර ශමීර මධුෂාන් සේනාරත්න, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය
සී/58656 කෙනි - පට්ටිවිල කංකානමලාගේ දිනේෂ් ලක්මාල් පට්ටිවිල, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58654 කෙනි - යකුදාගොඩ දිසානායකලාගේ ප්‍රභාත් දනංජය සමරනායක, ගැමුණු හේවා බළකාය
සී/58870 කෙනි - පමුණුවේ පරාඹේ ගෙදර මධුෂාන් ප්‍රියංකර බණ්ඩාර රණසිංහ, ශ්‍රී ලංකා සංඥා බලකාය
සී/58664 කෙනි - ඉඩම් ගෙදර කසුන් චාමර බංඩාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58882 කෙනි - අටුවේගෙදර ගන්හේවගේ ඩිල්ෂාන් සාරංග ගන්හේවගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය
සී/58878 කෙනි - දිසානායක මුදියන්සේලාගේ ලක්මාල් මධුසංක බංඩාර, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව
සී/58874 කෙනි - ලංකාධිකාරි මුදියන්සේලාගේ මධුසංක දමිත් දයාන් වීරතුංග, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව
සී/58852 කෙනි - බද්දේගමගේ ඕෂාන් ශ්‍රීලක් රණවීර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය
සී/58663 කෙනි - සිංගංකුට්ටි අච්චි අතුකෝරලලාගේ දොන් ටිශාන් පීරිස්, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58851 කෙනි - ගමමැද ලියන අප්පුහාමිලාගේ නිශාන්ත පුෂ්ප කුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58892 කෙනි - හෙට්ටිගමගේ නුවන් ඉන්දික හෙට්ටිගමගේ, ගජබා රෙජිමේන්තුව
සී/58873 කෙනි - වන්නිනායක මුදියන්සේලාගේ උපුල් චන්ද්‍රකාන්ත බංඩාර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකාය
සී/58871 කෙනි - පහල කපුරාලලාගේ දිලීප මධුශාන් රූපසිංහ, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය
සී/58649 කෙනි - වහල්කඩ ගෙදර කසුන් ප්‍රබෝධ ශ්‍රී ප්‍රේමලාල්, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58637 කෙනි - කුමාර ගුණපාලගේ ජනිත දිලුම් ඩැනියෙල්, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
සී/58844 කෙනි - දිසානායක මුදියන්සේලාගේ අසංග ප්‍රියසාද් රණසිංහ, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58651 කෙනි - රනිත අෂාන් චන්ද්‍රරත්න, ගජබා රෙජිමේන්තුව
සී/58846 කෙනි - ඔෂාන් මධුශංඛ තන්තිරිවත්ත, ගැමුණු හේවා බළකාය
සී/58522 කෙනි - යටිනුවර ගෙදර දීප ශ්‍රී වික්‍රමාන්විත, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58863 කෙනි - කුමාරගේ තරිඳු මාලක කුමාරගේ, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58861 කෙනි - ගාල්ලගේ එරංග ප්‍රියශාන්ත ගාල්ලගේ, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58862 කෙනි - පැලැදගේ කුෂාන් තරංග පැලැදගේ, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58864 කෙනි - අධිකාරි මුදියන්සේලාගේ නලින්ද ජයලත් අධිකාරි, ගජබා රෙජිමේන්තුව
සී/58538 කෙනි - හේවා වලිමුනිගේ ගයාන් සංජීව වලිමුනිගේ, ගැමුණු හේවා බළකාය
සී/58670 කෙනි - හේවා කංකානම්ගේ ඉරේෂ කරුණාසේකර, ගජබා රෙජිමේන්තුව
සී/58884 කෙනි - මුණසිංහ මුදියන්සේලාගේ කසුන් ගංගනාත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය
සී/58881 කෙනි - වික්‍රමසිංහ සේනානායක අප්පුහාමිලාගේ රසික හර්ෂාන් සේනානායක, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව
සී/58845 කෙනි - නදිත කසුන්ජිත් ගමගෙදර, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58857 කෙනි - බිබිලේ මුල්ලේ ගෙදර රංගන චතුර බණ්ඩාර විජබාහු පාබල රෙජිමේන්තුව
සී/58854 කෙනි - කෝන්ගල විජේසිංහ ආරච්චිගේ පුබුදු කෝසල ලංකේෂ්වර විජේසිංහ, ගැමුණු හේවා බළකාය
සී/58891 කෙනි - හපුආරච්චිගේ උදේෂ් සමීර හපුආරච්චිගේ, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58876 කෙනි - ජයනෙත්ති කෝරලාගේ යොහාන් සුමේද ජයනෙත්ති, ගජබා රෙජිමේන්තුව

සී/58860 කෙනි - කන්දගේ නැවුම් හසරැල් කන්දගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේව බළකාය
සී/58860 කෙනි - හේරත් මුදියන්සේලාගේ ප්‍රසාද් කිත්සිරි නුවන් හේරත්, ගජබා රෙජිමේන්තුව
සී/58883 කෙනි - රණවීර ආරච්චිලාගේ අනුෂ්ක චතුරංග රණවීර, ගැමුණු හේවා බළකාය
සී/58856 කෙනි - හේවා කොළඹගේ උදයංග චතුර කොළඹගේ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58869 කෙනි - සෙනවිරත්න වාසල මුදියන්සේලාගේ පමෝද රුසිරු උදලාගම, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය
සී/58642 කෙනි - වෙත්තසිංහගේ දොන් ධනුෂ්ක රුවන් කුමාර ඩයස්, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58886 කෙනි - ඒකනායක මුදියන්සේලාගේ දර්ශන ඒකනායක, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58868 කෙනි - අන්තෝනිදුර තරිඳු මධුරංග සිල්වා, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58875 කෙනි - වාසුර ගිහන්ත සේනාරත්න, ගැමුණු හේවා බලකාය
සී/58853 කෙනි - ලොකුලියන විශ්ව මධුභාෂණ කුමාර ලොකුලියන, ගජබා රෙජිමේන්තුව
සී/58848 කෙනි - කෝනාර මුදියන්සේලාගේ සුපුන් ලක්මාල් බංඩාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58850 කෙනි - කිතුල්ගොඩගේ සඳේශ් ආසිරි කිතුල්ගොඩ, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58847 කෙනි - ගීසර සමින්ද ඇලබොඩගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය
සී/58503 කෙනි - දිසානායක මුදියන්සේලාගේ සජිත් සම්පත් කරුණානායක, ගජබා රෙජිමේන්තුව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් 11 වැනි දින,
කොළඹ දී ය.

12-334

# රජයේ නිවේදන

## වන්දනා ගමන් ආඥාපනත

(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2014 මාතලේ අලුවිහාර රජමහා විහාරස්ථානයේ පොසොන් වන්දනා ගමන් පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග මාතලේ අලුවිහාර රාජමහා විහාරස්ථානයේ සෑම වන්දනා ගමනකටම අදාළ වේ.

3. කඳවුරු ප්‍රදේශ දිස්ත්‍රික් ලේකම්ගේ සාමාන්‍ය පරිපාලනය යටතේ පැවතිය යුතු අතර, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ඔහුට හෝ ඔහුගේ බලයලත් නිලධාරියාට මේ කටයුත්තේ දී සහාය දිය යුතු ය.

4. කිසිම වන්දනා කරුවකු උත්සවය ආරම්භ කිරීමට නියමිත දිනයට පෙර දිනයේ පැමිණීම හෝ උත්සවය අවසන් කළ දිනයට පසු දිනයේ දී කඳවුරු ප්‍රදේශය තුළ රැඳී සිටීම හෝ නොකළ යුතු ය.

5. පහත සඳහන් බලතල දිස්ත්‍රික් ලේකම් හෝ බලයලත් නිලධාරියා හෝ සතුවිය යුතු ය.

(අ) සේදීම සහ නෑමත්, බීම සහ ගෘහ කටයුතුත් සඳහා ජලය ගැනීමට යම් විශේෂ ස්ථාන වෙන් වශයෙන් වෙන් කිරීම.
(ආ) විවිධ පංතිවලට අයත් වන්දනා කරුවන් සඳහා වෙන වෙනම ස්ථාන නියම කිරීම.
(ඇ) ඕනෑම වන්දනා කරුවෙකුට එහා මෙහා ගමන් කිරීමට නිශ්චිත මාර්ග පිහිටුවීම.
(ඈ) වන්දනා කරුවන්ට දෙනු ලබන සියලුම ආහාර බෙදා හැරීම ක්‍රමවත් කිරීම.
(ඉ) රෝගී වන වන්දනා කරුවන්ගේ වාසය සඳහා ස්ථාන වෙන් කිරීම, ඔවුන් සමඟ වෙනත් අයගේ සම්බන්ධකම් ක්‍රමවත් කිරීම හා තහනම් කිරීම, ගමන් කිරීමට නොහැකි තත්වයක සිටින අය නවත්වා ගැනීම.
(ඊ) වාහන නතර කිරීම සඳහා ස්ථාන වෙන් කිරීම හා
(උ) භෝජන ශාලා කඩ මඩු සඳහා ස්ථාන වෙන් කිරීම.

කිසිම පුද්ගලයකුට දිස්ත්‍රික් ලේකම් හෝ බලයලත් නිලධාරියකු විසින් කරනු ලබන ඉහත උපඡේද හි දක්වා ඇති නියෝග උල්ලංඝනය නොකළ යුතු ය.

06. තත් කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් වෙන් කළ හෝ අනුමත කළ හෝ ස්ථානයක හැර වෙන අන් කිසි ස්ථානයක කිසිම අයෙකු මලමූත්‍ර නොකළ යුතු ය.

07. කැලි කසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ඇතිව වෙන් කරන ලද ස්ථානයක හෝ භාජනයක හෝ මිස කඳවුරු ප්‍රදේශයේ වෙන තැනක කිසිම අයකු ද්‍රව්‍ය කැලි කසල කිසිවක් නොදැමිය යුතු ය.

08. තත් කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ අවසර පත්‍රයක් නොලැබ කිසිම කෙනෙකු විසින් බේකරියක්, සිසිල් බීම කර්මාන්ත ශාලාවක් හෝ කෝපි කඩයක්, භෝජනාගාරයක් හෝ පිහිටුවීම නොකළ යුතු ය. අවසර පත්‍රය නොමිලේ නිකුත් කළ යුතු ය.

09. (1) වෙළඳාම සඳහා වෙළඳ ද්‍රව්‍ය තැබීම පිණිස දිස්ත්‍රික් ලේකම් විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් හෝ කඳවුරු ප්‍රදේශය තුළ වෙන් නොකරන ලද ස්ථානයක කිසිම අයෙකු කිසිම වෙළඳ ද්‍රව්‍යයක් විකිණීම සඳහා නොතැබිය යුතු ය.

(2) දිස්ත්‍රික් ලේකම් විසින් හෝ බලයලත් නිලධාරියකු විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් හෝ ඔවුන් නොමැති විට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් හෝ අපත්‍ය යැයි

ප්‍රකාශයට පත් කරනල ද කිසියම් ආහාර ද්‍රව්‍යයක් කිසිම අයකු විසින් නොවිකිණිය යුතු ය.

10. (i) සියළුම භෝජනාගාර, කෝපි කඩ සහ තේ කඩ පිරිසිදුව ද සනීපය රැකෙන අයුරින් ද පවත්වාගෙන යා යුතු ය.

(ii) විකිණීම සඳහා තබා ඇති සියළුම කෙටි කෑම වර්ග, කේක් වර්ග, රසකැවිලි වර්ග සහ පිසින ලද වෙනත් ආහාර ද්‍රව්‍ය නිසියාකාරයෙන් තනන ලද මැසි නිවාරණ වීදුරු පෙට්ටිවල තැබිය යුතු ය.

(iii) ඉවත දමන තේ, කෝපි, කිරි හා ඉඳුල් කිසිවක් හෝ ඉවුම් පිහුම් වල දී ඉවත දමන කිසිවක් හෝ වෙනත් කැලි කසල හෝ බිම නොදැමිය යුතු ය. එවැනි කැලිකසල සියල්ලක්ම සනීපාරක්ෂක අධිකාරී විසින් ගෙනයෑම සඳහා සෑම විටම සූදානම් කොට මෙහි මින්මතු නියමකර ඇති ආකාරයෙන් භාජනවල බහා තැබිය යුතු ය.

(iv) වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් සඳහා භාවිතා කරනු ලබන සෑම ගොඩනැගිල්ලක් ම නිර්මාණයක් හෝ ලීයෙන් හෝ ලෝහයෙන් හෝ ප්ලාස්ටික් වලින් සාදන ලද ඝන අඩි 4 1/2කට නොඅඩු ප්‍රමාණයේ කුණු බාල්දියක් තිබිය යුතු යුතු වේ. එම ගොඩනැගිල්ලේ නිර්මාණයේ හෝ ස්ථානයේ හෝ එකතු වන සියළුම කැලි කසල එම කුණු බාල්දියේ දැමිය යුතු වේ. තව ද එම බාල්දියේ කසල දමන හෝ එයින් කසල ඉවත් කරන අවස්ථාවල දී හැර අන්හැම අවස්ථාවකදීම ලී පියනක් හෝ ප්ලාස්ටික් පියන් හෝ ලෝහ පියනක් හෝ එම බාල්දිය වසා තැබිය යුතු ය.

11. බෝවන රෝගයකින් පෙලෙන කිසිම අයකු කඳවුරු ප්‍රදේශයට ඇතුළු නොවිය යුතුය. කිසිම කෙනෙකු විසින් බෝවන රෝගයකින් පෙළෙන අයකු කඳවුරු ප්‍රදේශයට කැඳවාගෙන ඒම හෝ කඳවුරු ප්‍රදේශයට ඇතුළු වීමට එවැනි අයෙකුට ආධාර කිරීම හෝ අනුබල දීම හෝ නොකළ යුතු ය.

12. උත්සව පෙරහැර කාලය තුළ දී කඳවුරු ප්‍රදේශය හැරයන ලෙස වන්දනා කරුවන්ට දිස්ත්‍රික් ලේකම් විසින් විධාන කිරීමත්, කවර මගකින් කවර වාහනයකින් නොහොත් කවර අයුරකින් වන්දනා කරුවන්ට පිටව යා යුතු දැයි තීරණය කිරීමත් නීත්‍යානුකූල විය යුතු ය.

13. කඳවුරු ප්‍රදේශය ඇතුළත දී බෝවන රෝගයක් වෙනත් අයෙකුට වැළඳී ඇති බව දැන දැනම එම වෙනත් අය සමග පදිංචිව සිටින සෑම අයෙකු විසින් ද එම කාරණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට දන්වා සිටිය යුතු ය.

14. දිස්ත්‍රික් ලේකම්ගෙන් පළමුව අවසර ලබාගෙන මිස කිසිම අයකු විසින් කඳවුරු ප්‍රදේශය ඇතුළත වීදියක් වශයෙන් භාවිතා කරනු ලබන නොහොත් ඒ සඳහා වෙන්කොට ඇති භූමියක් අයුතු ලෙස ඇදෙන පරිදි කඩ මඩුවක් සෑදීම හෝ ගොඩනැගිල්ලක් විශාල කිරීම හෝ නොකළ යුතු ය.

15. කිසිම කෙනෙකු විසින් කඳවුරු ප්‍රදේශයේ සිට සැතපුමක අරය ඇතුළත පහත සඳහන් දේ නොකළ යුතු ය :-

1. සැනකෙළි හා නැටුම් පැවැත්වීම,
2. නෘත්‍ය රගපෑම,
3. සූදු ක්‍රීඩා හා ලොතරැයි පැවැත්වීම,
4. මධ්‍යසාර මත්පැන් විකිණීම,
5. ශබ්ද විකාශන උපකරණ මගින් නිවේදන ප්‍රචාරය කිරීම,
6. ආගමට පටහැනි සහ බෞද්ධ විරෝධී පොත් පත් බෙදා හැරීම,
7. ගස්වල අතු කැපීම හෝ
8. ආගමික පුද පූජාවන් හා සම්බන්ධ නොවූ සංගීත හා ගායන කණ්ඩායම් සංවිධානය කිරීම හෝ ඒවාට සහභාගී වීම.

16. (1) මාතලේ දඹුල්ල මාර්ගයේ බිරිදේවල මංසන්ධියේ සිට අලුවිහාර පාසල් ප්‍රවේශ මංසන්ධිය අතර මහා මාර්ග කොටසෙහි කිසිම කෙනෙකු මෝටර් රථයක් නතර කිරීම හෝ නවතා තැබීම හෝ නොකළ යුතු ය.

(2) අලුවිහාර රාජමහාවිහාරස්ථානයේ අධිකාරීන්ට හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල හෝ අයත් වූ මෝටර් වාහනයකට හැර වෙනත් මෝටර් වාහනයකට ප්‍රධාන දොරටුවෙන් විහාර භූමියට ඇතුළු වීමට අවසර නොදිය යුතු ය.

(3) කිසි වාහනයකට විහාර මළුවට ඇතුළු වීමට හෝ නවතා තැබීමට අවසර නොදිය යුතු ය.

(4) වාහන නතර කර තැබීම සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් වෙන් කොට දක්වනු ලබන ස්ථාන පොලිසිය විසින් දැන්වීම් පුවරු මගින් දක්වා තිබිය යුතු ය.

(5) පෙරහැර කාලය තුළ දී රාජකාරියේ යෙදී සිටින පොලිස් නිලධාරියකු විසින් දක්වනු ලබන දිසාවන්ට හෝ සංඥාවලට අනුකූලව රියදුරන් විසින් වාහන පැදවිය යුතු ය.

17. කඳවුර ප්‍රදේශය ඇතුළත කිසිම කෙනෙකු මනුෂ්‍ය පරිභෝජනය සඳහා කිසිම සතෙකු මැරීම හෝ ඝාතනය කිරීම හෝ නොකළ යුතු ය.

18. කඳවුරු ප්‍රදේශය ඇතුළත හෝ එම ප්‍රදේශයේ සීමාවන් හි සිට සැතපුමක අරයක් ඇතුළත හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගෙන් ඒ සඳහා පළමුව අවසර නොගෙන කිසිම අයකු විවිධ ගිනිකෙළි හෝ තුවක්කු ආදි වෙඩි තැබීමේ උපකරණ පත්තු නොකළ යුතු ය.

18. මෙම නියෝගවල :

* බලයලත් නිලධාරියා යනුවෙන් දිස්ත්‍රික් ලේකම් විසින් බලය පවරනු ලබන නිලධාරියා අයත් වේ.
* කඳවුරු ප්‍රදේශය යනුවෙන් මෙහි උපලේඛනයේ දක්වා ඇති ප්‍රදේශය වේ.
* දිස්ත්‍රික් ලේකම් යනුවෙන් මාතලේ දිස්ත්‍රික් ලේකම් අදහස් වේ.
* සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී යනුවෙන් මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අදහස් වේ.
* මොටර් වාහනය යන්නේ අර්ථ නිරූපණය (2013 වැනි අධිකාරය වන) මෝටර් ප්‍රවාහන පනතේ ඊට දී ඇති අර්ථ නිරූපණයම වේ.
* ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී යනුවෙන් මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අදහස් වේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහසිය පත්තුවේ අලුවිහාර ග්‍රාම නිලධාරී වසමට අයත්වන පහත දැක්වෙන මායිම්වලින් වට වූ අලුවිහාර ප්‍රදේශය කඳවුරු ප්‍රදේශය යන්නෙන් අදහස් කෙරේ.

උතුරට : රණවිරු ගම ;
දකුණට : අලුවිහාරේ ගම, සර් රිචඩ් අලුවිහාරේ මාවත සිට පිවිතුරු මාවත ;
නැගෙනහිරට : අලුවිහාරේ පාලුගම, සමන්දාව, දික්කිරිය ගම ;
බස්නාහිරට : අලුවිහාරේ කොටසක්, සරණංකර මාවත, ත්‍රිකුණාමල වීදිය, බිරිදේවල, අලුවිහාරේ 1, 2 ජනපද මායිම් අතර වූ භූමි ප්‍රදේශය

12-299

---

## වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

### නියෝග

1. මේ නියෝග "මාතර, වෙහෙරහේන පූර්වාරාම රජමහා විහාරයේ වාර්ෂිකව පවත්වනු ලබන රුහුණු උඳුවප් පෙරහැර" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති " යන්නෙන් මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධාරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද අදහස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. "මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙහෙරහේන ග්‍රාම නිලධාරි වසමට අයත් වෙහෙරහේන පූර්වාරාම රජමහා විහාරයේ " රුහුණු උඳුවප් පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (i) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(ii) මේ නියෝගයේ (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතුය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුර පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය ඃ

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනා කරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුණ්‍ය කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකිය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන්කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ලිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ලිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධාරියාට බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද, එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ලිඳක, දිය වලක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රවමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරි විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින්

ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා හෝ මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේ ය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතුය.

22. (i) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේ ය.

(ii) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

(30) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වෙලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙහෙරහේන ග්‍රාම නිලධාරී වසමට අයත් වෙහෙරහේන පූර්වාරාම රජමහා විහාරස්ථානයේ පිහිටි භූමිභාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :

| | |
|---|---|
| *උතුරට* | : දවුලගල සංසරතන මාවත ; |
| *දකුණට* | : විශ්‍රාම ශාලාව පිහිටි ඉඩම සහ තේක්ක ගහ කොරටුව ; |
| *නැගෙනහිරට* | : වැපි පිට්ටනිය කුඹුර සහ දිවුල් ගහ කොරටුව |
| *බස්නාහිරට* | : ගනහේන ඉඩම, සායක්කාර වත්ත සහ පොදු සුසාන භූමිය |

12-298

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංක පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනා

ණය ගිණුම් අංකය : 609969.
කුරුප්පු ආරච්චිගේ සුනිල් ජයතිස්ස.

2014 ඔක්තෝබර් 31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නෙතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2003 ඔක්තෝබර් 10 දින සහතික කරන ලද අංක 2280, දරන දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතුමුදල් ගෙවීම කුරුප්පු ආරච්චිගේ සුනිල් ජයතිස්ස ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූතුන්ලක්ෂ විසිදෙදහස් හත්සිය තිස් නමයයි ශත අනූ දෙක (රු.8,322,739.92) ක මුදලක් 2014 සැප්තැම්බර් 4 දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී අසූතුන්ලක්ෂ විසිදෙදහස් හත්සිය තිස් නමයයි ශත අනූ දෙක (රු.8,322,739.92) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 සැප්තැම්බර් 5 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,620,622.44 ක මුදල මත 15% වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 2280 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝප් වීදියේ අංක 182 හි 3 වන මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන්හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාවේ කොළඹ 02 කොට්ඨාස අංක 24 (සුදුවැල්ල) තුළ හයිඩ් පාක් කෝනර් හි පිහිටි කොළඹ 2 හයිඩ් පාක් කෝනර් වරිපනම් අංක 79 4/3, දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 2003 ජනවාරි 4 වන දින සාදන ලද අංක 1352 දරන සභාධිපත්‍ය හතරවන මහලේ තට්ටු නිවාස ඒකක අංක 01A/F4/U7 හි සාලය, කෑම ශාලාව, නිදන කාමර 3 ක් මුළුතැන්ගෙය, ගබඩා කාමරය, වැසිකිළි 3 ක් රෙදිවේලන ප්‍රදේශය සහ සඳළුතල දෙකකින් සමන්විත වන අතර ඉහත සඳහන් කළ සභාධිපත්‍ය හතරවන මහලේ අංක 01A/F4/U7 දරන තට්ටු නිවාස ඒකකයට මායිම් වශයෙන්, උතුරට : මෙම ඒකකය සහ 1CE1 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ස්ථානය උඩින් වෙන්කරන බිත්තිය.

නැගෙනහිරට : මෙම ඒකකය සහ 1CE1 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ස්ථානය උඩින් වෙන්කරන බිත්තිය.

දකුණට : මෙම ඒකකය සහ 1A/F4/U8 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ඒකකය වෙන් කරන බිත්තිය මැද, මෙම ඒකක සහ 1CE7 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ස්ථානය වෙන්කරන බිත්තිය. මෙම ඒකක සහ 1A/F4/U8 දරන ඒකකය වෙන් කරන බිත්තියේ මැද සහ මෙම ඒකකය 1CE3 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ඒකකය වෙන් කරන බිත්තිය.

බස්නාහිරට : මෙම ඒකය 1CE13 දරන පොදු අවශ්‍යතා සඳහා ඇති ඒකකය වෙන් කරන බිත්තිය. මෙම ඒකකය 1A/F4/U6 දරන ඒකක වෙන්කරන බිත්තියේ මැද සහ මෙම ඒකකය 1CE3 දරන පොදු අවශ්‍යතා සඳහා වන ඒකකය වෙන් කරන බිත්තිය.

උසින් : මෙම ඒකකය 1A/F5/U7 දරන ඒකකය වෙන්කරන කොන්ක්‍රීට් තට්ටුව මැද

පහතින් : මෙම ඒකකය 1A/F5/U7 දරන ඒකකය වෙන් කරන කොන්ක්‍රීට් තට්ටුව මැද

මෙහි බිම් ප්‍රමාණය වර්ග මීටර් 171.246 ක් (වර්ග අඩි 1887.516) වේ.

මෙම ඒකකයේ සාලයක්, කෑම ශාලාවක්, නිදන කාමර 3 ක්, මුළුතැන්ගෙයක්, ගබඩාවක්, වැසිකිළි 3 ක් රෙදි වේලන කොටසක් සහ සඳළුතල 2 ක් ඇත.

පොදුවේ සලකා බලන විට මෙම ඒකකයේ වටිනාකම මුළු සභාධිපත්‍ය දේපළ වටිනාකමින් 1.117% ක ප්‍රමාණයක් වේ.

මෙම ඒකකයට ඇති ආසන්නම ප්‍රවේශ මාර්ගය පොදු අවශ්‍යතා 1CE13 වේ.

මෙම ඒකකය ලොට් 1 හි A ගොඩනැගිල්ලේ අතුරු බෙදීම ඒකකයක් වන අතර උපකාරී ඒකක 1A/F4/47/A59 සමග වෙන්කොට දෙන ඒකකයක් වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con/A105/139 යටතේ ලියාපදිංචි කර ඇත.

පොදු අවශ්‍යතා

සභාධිපත්‍ය දේපළ පිළිබඳ ව්‍යවස්ථාපිත අර්ථනිරූපනය දක්වා ඇත්තේ 1982 සංශෝධිත පනත් අංක 45 න් සංශෝධනය කළ කුලී නිවාස අයිතිය පිළිබඳ 1973 අංක 11 දරන නීතිය සංශෝධනය කළ 1973 12 වන වගන්තියේ ය

A ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මෙම ඉඩම සභාධිපත්‍ය දේපළට අයත් විවෘත ප්‍රදේශය

B අත්තිවාරම් කුළුණු, කණු, බාල්ක, මහබාල්ක ආධාරක ප්‍රධාන බිත්ති ගොඩනැගිල්ලේ මහලේ ඇති ටෙරසය.

C විදුලිය සහ ස්ථාන ගත විදුලිය උත්පාදක ජෙනරේටර්, ඉන්ධන රැස්කරන ටැංකි, ජලය සැපයුම, ජල කරාම සහ බට, වතුර මෝටර් ගොනැගිල්ලේ මුදුනේ ජලය රැස්කරන ටැංකි යනාදිය සපයන පොදු සේවා සැපයීම.

අප ජලය මුදා හැරීමේ ක්‍රමයට අයත් වන පයිප්ප, මැන්හෝල් පයිප්ප, ජල පොම්ප ආදිය දුමක් ඇතිවූ විට ඒවා දැන ගැනීමේ උපක්‍රම, ගිණිනිවීමේ බට, ගිණිනිවීමේ උපකරණ අනතුරු හැඟවීමේ සීනු ඇතුළු ගිණි ආරක්ෂක සේවාව

සෝපාන 2 ක් ඇතුලු මහල් අතර ගමනා ගමන ක්‍රමය

හුළං කවුළු රස්නය පිටකරන කවුළු සහ රස්නය පිටකරන පංකා ඇතුලු වාතාශ්‍ර ක්‍රමය

MATV ක්‍රමය අදාළ කේබලය හඬ වැඩකිරීමේ උපකරණ සහ ඊට සම්බන්ධ අනෙකුත් උපංග

CCTV කැමරා සහ අනතුරු හඟවන සංඥා ආදිය ඇතුළු ආරක්ෂක සංඥා ක්‍රමය

ප්‍රවාහන සඳහා කැළි කසළ එකතු කරන විශාල බහාලුමක් ඇතුළු කසල ඉවත් කිරීමේ ක්‍රමය

D දේපළවල සුමුටු පැවැත්ම සඳහා අවශ්‍ය සියලු දේ සහ පහසුකම් ආරක්ෂාව ඇතුලු පොදුවේ පරිහරණය කෙරෙන සියලු දේද වේ.

පොදු අවශ්‍යතා පිළිබඳ අර්ථනිරූපනය හා විස්තර දැක්වීම සහ සටහනින් හෝ වචනයෙන් පිඹුරු පත්වල පෙන්වා ඇති අංශ වේ.

අයිසීර් 1ඒ ඉඩම සහ ගොඩනැගිල්ල වටා ඇති හිස් බිම් ප්‍රමාණය සහ ගොඩනැගිල්ලට ඇති ප්‍රවේශ මාර්ගය.

බී වාතාශ්‍රය සඳහා ඇති විවෘත ප්‍රදේශය.

සී ඉඩම සහ ප්‍රවේශ මාර්ගය සියලු ඒකකයන් හෝ පොදු පරිහරණය සඳහාය

ඩී ගොඩනැගිලි ඒකකවල පිටතින් සවිකොට ඇති සේවා නළ

අයිසීර් 2 පළමුවන මහලේ සිට එකොළොස්වන මහල දක්වා වායුසමීකරණ උපකරණ තබා ගන්නා විවෘත ප්‍රදේශය.

අයිසීර්3 පළමුවන මහලේ සිට එකොළොස්වන මහල දක්වා වායුසමීකරණ උපකරණ තබා ගන්නා විවෘත ප්‍රදේශය.

අයිසීර්4 පළමුවන මහලේ සිට එකොළොස්වන මහල දක්වා වායුසමීකරණ උපකරණ තබා ගන්නා විවෘත ප්‍රදේශය.

අයිසීර් 5 පළමුවන මහලේ සිට එකොළොස්වන මහල දක්වා වායුසමීකරණ උපකරණ තබා ගන්නා විවෘත ප්‍රදේශය

අයිසීර් 6 පොදු ප්‍රයෝජනය සඳහා වූ කාර්මික සහ ජලනලය

අයිසීර් 7 පොදු ප්‍රයෝජනය සඳහා වූ කාර්මික සහ ජලනලය

අයිසීර් 8 පොදු ප්‍රයෝජනය සඳහා වූ කාර්මික සහ ජලනලය

අයිසීර් 9 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලි නළ, ප්‍රවේශ ශාලාව, නැවතී සිටීමේ ශාලාව, ආරක්ෂක කාමරය, ට්‍රාන්ස්ෆෝමර් කාමරය, විදුලි මීටර් කාමරය, විදුලිය බෙදා හැරීමේ කාමරය, පිළිගැනීමේ ස්ථානය, ගෑස් සිලින්ඩර් ගබඩාව සහ ධාවන මාර්ගය මෙහි පිහිටා ඇත. මෙම බිම් මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 10 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ සහ වායු පීඩන නළ ආදිය පිහිටි සහ විවෘත ප්‍රදේශයක් ඇති මෙම කොටස පළමුවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 11 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය. පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස දෙවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 12 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස තුන්වන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 13 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස හතරවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 14 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපානා සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස හයවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර්15 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරනනන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනි නිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස හයවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 16 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක්ද ඇති මෙම කොටස හත්වන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 17 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළකසළ ශෝධක කාමරය, ගිනිනිවීමේ

ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස අටවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 18 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරනන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ, සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස නමවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 19 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස දහවන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 20 එහා මෙහා ගමන් කිරීමේ ප්‍රදේශය, පිරිසිදු කරනන්නන්ගේ කාමරය, සෝපාන සේවාව, ප්‍රධාන නළ කසළශෝධක කාමරය, ගිනිනිවීමේ ඒකකය, අඩුබලැති විදුලිය නළ, වායු පීඩන නළ සහ විවෘත ප්‍රදේශයක් ද ඇති මෙම කොටස එකළොස්වන මහලේ පිහිටා ඇති පොදු පරිහරණය සඳහා වූ ප්‍රදේශයකි.

අයිසීර් 21 විදුලිය උත්පාදන කාමරය, මෝටර් කාමරය, සිසිල් කිරීමේ කුළුණ, සේවා ඒකකය, ගබඩා කාමරය, පඩිපෙළ සහ වහල මතුපිට විවෘත ප්‍රදේශයේ පොදු පරිහරණය සඳහා වේ.

අයිසීර් 22 දුම් ශාලාව, සෝපානය, ගිණි නිවීමේ සෝපානය, විදුලිය නළ, වතුර මෝටර් කාමරය, වතුර ටැංකිය. ආරක්ෂක කාමර පිරිසිදු කරන්නන්ගේ කාමර, වැසිකිළි සහ ධාවන මාර්ගය පොළොව යට තට්ටුවේ පිහිටා ඇති අතර එය පොදුවේ පරිහරණය වේ.

අයිසීර් 23 දුම් ශාලාව, සෝපානය, ගිණි නිවීමේ සෝපානය, සේවා, විදුලිය නළ, වතුර මෝටර් කාමරය, ආරක්ෂක කාමර, පිරිසිදු කරනන්න්ගේ කාමර, භුමාලයෙන් නාන ස්ථානය, පිහිනුම් තටාකය, ආපන ශාලාව, ගබඩාව, මුළුතැන්ගෙය, වැසිකිළි, ධාවන මාර්ගය ආදිය බිම්මහලය සහ පළමු මහලය අතර ඇති තට්ටුවක පිහිටි අතර ඇති තට්ටුවක පිහිටි අතර එය පොදුවේ පරිහරණය සඳහා වේ.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

12-436

---

### යෝජනා සම්මුතිය නිවැරදි කිරීමයි

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව

2014 නොවැම්බර් මස 14 වන දිනැති අංක 1889 දරන රජයේ *ගැසට් පත්‍රයේ* 1 වන කොටසේ 1 වන ඡේදයේ 11-421 දරන අංකය යටතේ පළ වූ ඉහත ශීර්ෂය සහිත යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමෙහි දැක්වෙන උපලේඛනයේ 9 වන පේලියෙහි ඉඩම "ලොට් 2 දරන කැබැල්ල" යනුවෙන් වැරදි ලෙස සඳහන්ව ඇති අතර එය 'ලොට් 1 දරන කැබැල්ල" යනුවෙන් නිවැරැදි විය යුතු ය.

කළමනාකරු,
ණය අයකර ගැනීම්

12-453

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.